**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. HRC/Suo/Motu/11/20 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020.06.11

ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත.

**<u>කොවිඩ් අරමුදලට පරිත්‍යාග සදහා රජයේ සේවකයන්ගේ වැටුප් අඩු කිරීම.</u>**

කොවිඩ් 19 වසංගතයෙන් රටම අර්බුදයට පත්ව ඇති අවස්ථාවක ඒ සදහා අරමුදලක් ඇතිකොට ඊට දායකත්වය ලබාදීමට හැකියාවක් ඇති අයට මුදල් පරිත්‍යාග කිරීමට රජය විසින් අවස්ථාව සකසා ඇත.

මෙයට සමගාමීව රජයේ සේවකයන්ගේ කැමැත්ත මත වැටුප හෝ වැටුපෙන් අඩක් හෝ දිනක වැටුප පරිත්‍යාග කරන ලෙස ජනාධිපති ලේකම්වරයා විසින් රාජ්‍ය සේවකයන් සියළු දෙනා හට ඔවුන්ගේ ප්‍රධානීන් මගින් 2020.05.05 දිනැතිව පුද්ගලික ආයාචනයක් ලිඛිතව සිදුකර ඇත.

මේ දින වල විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් විසින් සේවකයන් වෙත ඉහත ආයාචනය අනුව සේවකයන්ගෙන් මුදල් පරිත්‍යාග ලබාගැනීම සදහා ලිපිලේඛන යොමු කරන අතර, එම ලිපිලේඛන අනුව වැටුප හෝ ඉන් කොටසක් අඩුකර යැවීම අනිවාර්ය කරුණක් බවට පත්වී ඇති බවත්, ඒ සදහා රජයේ සේවකයන්ට වක්‍රව හා සෘජු බලපෑම් ඇති බවටත් මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇත.

උදාහරණ ලෙස උතුරු පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව මේ සදහා මැයි මාසයේ දිනක වැටුප් අඩුකිරීමට උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවකයන්ගේ කැමැත්ත ලබාගැනීම සදහා සම්පූර්ණ කිරීමට පෝරමයක් යොමු කර ඇති අතර, එම පෝරමය සම්පූර්ණ කර නොඑවන පාසල් සදහා මැයි මාසයේ වැටුප් පත නිකුත් නොකරන බව දන්වා ඇත.

එමෙන්ම, වැටුප හෝ ඉන් කොටසක් අඩු කර ගැනීමට කැමැත්ත ලබාදෙන හා කැමැත්ත ලබානොදෙන සේවකයන්ගේ නාමලේඛනයක් ඉල්ලා සිටීම හා වැටුප අඩු කිරීමට කැමැත්ත ලබාදුන් සියළුම නිලධාරින්ගේ නම් ලයිස්තුවක් ගොනු කර පවත්වා ගැනීමට උපදෙස් දීම තුළින් මේ සදහා කැමැත්ත ලබානොදුන් සේවකයන්ට වෙනස් කොට සැලකීමක් සිදුවීමට ඉඩ ඇති බවට නිරීක්ෂණය වන අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි.

ඒ අනුව සේවකයන්ගේ කැමැත්ත මත වැටුප හෝ ඉන් කොටසක් පරිත්‍යාග කිරීමට ආයතන ප්‍රධානීන්ගේ මාර්ගයෙන් දැනුම්දීම දැනටමත් ගැටලුවක් බවට පත්ව ඇති බැවින්, එය සෘජුවම සේවකයන් වෙත දැනුම් දී ඔවුන්ගේ ස්වකැමැත්ත මත මෙම පරිත්‍යාග ලබා ගැනීම කළ යුතු බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ කර සිටී.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එබැවින් මේ පිළිබඳ ඔබගේ අවධානය යොමු කර රජයේ සේවකයන්ගේ වැටුපෙන් කොවිඩ් අරමුදලට මුදල් පරිත්‍යාග ලබාගැනීමේ දී ඔවුන්ගේ ස්වකැමැත්ත මත පමණක් සිදුකිරීමට කටයුතු කරන ලෙසත්, වෙනත් කිසිදු ආකාරයක බලපෑමක් ඇති නොවීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඉහත දැනුම්දීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මා වෙත ලබා දෙන ලද උපදෙස් අනුව බව කරුණාවෙන් සලකන්න.

ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ටී.ඩී. විමලසූරිය
ලේකම් - රා.ඉටු.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

1. ගරු අමාත්‍යතුමා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
2. සියළුම ගරු ප්‍රධාන අමාත්‍යවරුන් වෙත
3. ගරු ජනාධිපති ලේකම්තුමා